# මාධ්‍ය නිවේදනය

## ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග - 2026
## (ප්‍රාචීන පණ්ඩිත ප්‍රාරම්භ/ මධ්‍යම/ අවසාන)

2026 අප්‍රේල් මස පැවැත්වීමට නියමිත **ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ විභාග** සඳහා මාර්ගගතව අයදුම්පත් කැඳවනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි මහ පිරිවෙන්, විද්‍යායතන පිරිවෙන්, බෞද්ධ සීලමාතා අධ්‍යාපන ආයතන හා විශේෂ පිරිවෙන්වලට නිකුත් කර ඇති පරිශීලක නාම හා මුරපද භාවිත කර මෙම විභාගය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

මෙම විභාගයට ඉදිරිපත් වන පෞද්ගලික අයදුම්කරුවන්ට ද විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා මාර්ගගතව අයදුම් කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීම පිළිබඳ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කර ඇත. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියට (https://doenets.lk) පිවිස **"අපගේ සේවා"** යටතේ ඇති **"Piriven Exam Information Center"** වෙත පිවිසෙන්න.

මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2026 මාර්තු මස 04 දින පෙ.ව. 9.00ට ආරම්භ වන අතර 2026 මාර්තු මස 18 දින ප.ව. 9.00ට අවසන් වේ.

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.
2026.02.27